# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර - 2018

## නීති විද්‍යාව

## (පැ තුනයි)

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 07**

ඕනෑම ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

1. 'කාලීනව ජනතාවගේ සමාජයීය අවශ්‍යතාවයන් හැඩගැන්වෙන්නේ සහ වෙනස්වෙන්නේ කෙසේද යන්නත්, ..... අසමානතාවයන් පවතින තත්ත්වයන්හිදී සාමූහික නියෝජිතයන් වශයෙන් සමාජ කණ්ඩායම් ගොඩනැංවෙන්නේ සහ බිඳවැටෙන්නේ කෙසේද යන්න පිළිබඳවත්; සමාජයේ බලවත් කණ්ඩායම්වල සංස්කෘතිකමය ආධිපත්‍යය අභියෝගයට ලක්වන්නේ කෙසේද යන්නත්;... හුවාදැක්වීමට නීතිය පිළිබඳව වන න්‍යායකට හැකිවිය යුතු අතර, .... එමගින් විමුක්තිදායක සමාජමය වෙනස්කමකට සහ දේශපාලනමය ක්‍රමයකට ඇති අපේක්ෂාවන් වෙත මංපෙත් විවෘත කළ යුතුය.'

   ඔබේ අදහසට අනුව කවර නීති න්‍යායයක් තුළ මෙම ගති ලක්ෂණ ආසන්න වශයෙන් අඩංගු වේද? නිදර්ශන මගින් පැහැදිලි කරන්න.

2. විනිශ්වයකාරවරුන් "අසීරු නඩු" විසඳන්නේ කෙසේද? ඔබ තෝරාගන්නා ඕනෑම නීතිබලප්‍රදේශයකින් උචිත නිදසුන් උපුටා දක්වමින්, ඔබට සුපුරුදු න්‍යායක් ඇසුරෙන් මෙම ප්‍රශ්නයට විවේචනාත්මකව ප්‍රතිචාර දක්වන්න.

3. නීතිය ආඥාවක් ලෙස හුවාදැක්වෙන න්‍යායයේ ඇති දුර්වලතා ගෙනහැර පාමින් එච්. එල්. ඒ. හාර්ට් විසින් ඉදිරිපත් කරනුලැබූ න්‍යායය නීතිය පිළිබඳව අපගේ තේරුම්ගැනීම කවර ප්‍රමාණයකින් පුළුල් කිරීමට සමත් වූයේදැයි තක්සේරු කරන්න.

4. නීතිය පිළිබඳව හැන්ස් කෙල්සන් විසින් ඉදිරිපත් කළ න්‍යායය යම්කිසි රටක නීති පද්ධතියක වලංගුතාවය තීරණය කිරීමට කෙසේ උපකාරී වන්නේදැයි නිදසුන් ගෙනහැර දක්වමින් විවේචනාත්මකව පිරික්සන්න.

5. මුල් අවස්ථාවේ සිටින නිදහස් සහ විචාරශීලී පුද්ගලයන් විසින් අවිද්‍යාවේ තිරයට පිටුපසින් සිටිමින් එකඟවනු ලබන මූලධර්ම යුක්තියේ නිවැරදි මූලධර්ම වන බව ජෝන් රෝල්ස් තර්ක කරයි. කෙසේ වුවද, අවම රාජ්‍ය සංකල්පය (minimal state) සහ හිමිකම් ලබාගැනීමේ න්‍යාය (entitlement theory) පිළිබඳව රොබර්ට් නොසික් අදහස් දක්වයි. ශ්‍රී ලංකාව වැනි රටකට මෙවැනි න්‍යායයන්හි උචිත/අනුචිත භාවය අනුසාරයෙන් කරනු ලබන විග්‍රහයක් තුළින් මෙම න්‍යායයන් දෙක පිළිබඳව වන ගුණ-දොස් විචාරීමක් කරන්න.

6. (අ) **හෝ** (ආ) කොටස් දෙකෙන් **එකකට** පිළිතුරු සපයන්න.

   (අ) නිදහස් මතධාරීන් විසින් අයිතිවාසිකම් පිළිබඳව දරනු ලබන මතයේ පවත්නා දේශපාලනමය සහ දාර්ශනික බංකොලොත්භාවය විවේචනාත්මක නීති ව්‍යාපාරය විසින් පරිභවයට ලක්කරනු ලබයි. තවද, මනුෂ්‍ය ස්වභාවයේ පවතින සංකීර්ණතාවයන් හුවාදක්වන විවේචනාත්මක නීති ව්‍යාපාරය, ඓතිහාසිකව නිර්මාණයවූ බල පරතරයන් විසින් මානව වර්ගයා වෙත එල්ලකරනු ලබන තර්ජන වැළැක්වීමට නූතන නීතිවල ඇති අපොහොසත්භාවයද විස්තර කරයි.
   පැහැදිළි කරන්න.

   (ආ) කාන්තවාදී නීති න්‍යායයේ පොදු අරමුණු විශ්ලේෂණය කරන්න. තවද, කාන්තාවාදී නීති න්‍යායයේ අනු න්‍යායයන් අවම වශයෙන් තුනක ඇති විශේෂ ලක්ෂණ විශ්ලේෂණය කරමින්, ඔබ තොරාගන්නා ඕනෑම නීති බලප්‍රදේශයකින් උපුටා දැක්වෙන අධිකරණ තීරණ සහ ආණ්ඩුක්‍රමව්‍යවස්ථාමය / ව්‍යවස්ථාමය ප්‍රතිපාදන තුළින් එකී එක් එක් අනු න්‍යායයේ ඇති සුවිශේෂීභාවය විශ්ලේෂණය කරන්න.

7. (අ) හෝ (ආ) කොටස් දෙකෙන් එකකට පිළිතුරු සපයන්න.

(අ) මානව හිමිකම් පිළිබඳව වන නූතන අදහසට නීතිය පිළිබඳ සමාජවිද්‍යාත්මක සංකල්පයක් තුළ කවර ඉඩප්‍රමාණයක් සලසා දියහැකිදැයි විවේචනාත්මකව අගයන්න.

(ආ) "සමාජය සහ නීතිය යනු ව්‍යුහාත්මක, තාර්කික සහ අභ්‍යන්තර වශයෙන් අවිරෝධී ආයතන ලෙස නීති න්‍යායයක් තුළින් හුවා දක්වන්නාවූ චිත්‍රය ප්‍රතික්ෂේප කරනුලබන පශ්චාත්-ව්‍යුහාත්මක හෝ පශ්චාත්-යථාදෘෂ්ඨිවාදී න්‍යායයක් ලෙස පශ්චාත්නූතනවාදය දැකීම යම් ආකාරයකට වඩාත් සුදුසු වේ."

නිදසුන් ගෙනහැර දක්වමින් විවේචනාත්මකව අදහස් දක්වන්න.

----------------